# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ.) විභාගය

පැරණි නිර්දේශය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය 02

**සිංහල 11** **71 S 11** **පැය තුනයි**

උපදෙස්:

- **1** කොටසේ **1** ප්‍රශ්නය ද, **11** කොටසේ **2,3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**1** කොටස

**1..** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

**01.** කණ්ඨජාක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1) ච, ඡ, ජ, ඣ, ඤ
2) ප, ඵ, බ, භ, ම
3) ක, ඛ, ග, ඝ, ඞ
4) ත, ථ, ද, ධ, න
5) ට, ඨ, ඩ, ඪ, ණ

**02.** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1) විස්නු ලතෙත් සැලලිහිනි ප්‍රවාහන
2) විෂ්ණු ළතෙත් සැළලිහිණි ප්‍රවාහණ
3) විශ්ණු ලතෙත් සැලලිහිනි ප්‍රවාහන
4) විශ්නු ළතෙත් සැළලිහිණි ප්‍රවාහණ
5) විෂ්නු ලතෙත් සැළලිහිණි ප්‍රවාහන

**03.** අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1) ඇන්ටන් චෙකොෆ්, ගී ද මෝපසං, ෆ්ලෝ බෙයා, නිකොලායි ගොගොල්
2) කීර්තිරත්න, ගුණරත්න, ගුණසේන, ගුණවර්ධන
3) අමාවතුර, දහම් සරණ, කුස දා කව, ගුත්තිල කාව්‍යය
4) ඉනාව, විශාරද, සයනය, සල්ලාල
5) නරි බෑනා, මනමේ, සිංහබාහු, හස්තකාන්ත මන්තරය

**04..** පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) 'ච' අක්ෂරයට පෙර සැමවිට ම මූර්ධජ 'ෂ' කාරය යෙදෙයි.
2) සමීපාර්ථය දනවන පද ඇරඹෙන්නේ දන්තජ 'ල' කාරයෙනි.
3) සිංහලයේ කවර පදයකවත් අවසාන අක්ෂරය ලෙස 'ණ්' නො යෙදේ.
4) 'ප'අක්ෂරයට පෙර ව යෙදෙන්නේ දන්තජ 'ස' කාරයයි.
5) 'ල' අක්ෂරයේ පාපිල්ල සහිත සංකේතය ව්‍යවහාර වන්නේ 'ඵ' යනුවෙන් ය.

05.යංශය, විසර්ජනිය, ගයනුකිත්ත හා අනුස්වාරය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

1) ව්‍යාකරණ, අර්ථඃ, ප්‍රාකාරය, වංශය
2) සංචාරය, පෞරාණික, මූර්තඃ. භාග්‍යය
3) තපඃ, ප්‍රඥාව, ලංකාව, ව්‍යාජ
4) විද්‍යාලය, අන්තඃපුරය, පෞරුෂය, සංහිඳ
5) ව්‍යංජන ,සුගන්ධඃ, ඖෂධීය, මහාවංශය

06. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1) පෙර කිරිය, ශාරිපුත්‍ර, අදිසි රුව, අශ්වාරෝහක
2) මුඛ පියුම, අහස ගඟ, දිව්‍ය ඖෂධ, කිරි සයුර
3) රථාචාර්යය, ආගම සඳ, පස්වරු, සරු බිම
4) ස්වර්ණාභරණ, මහා රජින, දම් සබය, කෙළි බිම
5) කර්තෘ පිරිස, මිහි කාන්තාව, සක් දෙව්, සප්ත ස්වර

07. තත්සම, තද්භව හා නිෂ්පන්න වචන පිළිවෙළින් යෙදී ඇති වර්ණය කුමක් ද?

1) චුම්බන,කුරුඳු, ගිනි
2) කරුම, අක්‍ෂි, නැවුම්
3) කකුල, පිතා, හෘද
4) චතුර්, පසිඳු, කෝරාළ
5) පුලුටු, මධුර, සිරුර

08. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නො දෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1) සම්ප්‍රයෝග - වියෝග, විප්‍රයෝග, වෙන් වීම, දුරස් වීම
2) ජාත - අවජාත, සුජාත, අභිජාත, විජාත
3) දැහැමි - අදැහැමි, නොදැහැමි, අධාර්මික, පාපී
4) ආකාශය - වසුධා, අවනී, මේදිනි, පයවි
5) දුක්ඛ - තොස, තුට, ඔකඳ, නඳ

09. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නො වන වරණය තෝරන්න.

1) සූර්යයා - පිනිපා, ආදිච්ච, පතංග, බාසුරු
2) නිවන - මෝක්ෂ, අමත, අපමග, නිරෝධ
3) මනිමේඛලා - මිණිමෙවුල, රසන්දම, මෙවුල, රසනා
4) සඳ - තාරපති, පණ්ණරසී, සියරැස්, නිශාපති
5) බල්ලා - සුනඛ, සෝන, කුක්කුර, කුක්කා

10. විභක්ති, විශේෂණ, ද්'කාරාර්ථ, අන්‍යාර්ථ යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1) සඳවත, ගස්වැල්, සුන්තුරු, බිඟුනද
2) සිහවගවලස්, ඉකුත්සයුරු, දෙව්දත්, සත්කුලපවු
3) නරදෙවි, වේපස්, අඹුසැමි, සුන්බත්
4) සේනකපඬි, සරාසඳ, දුන්වත්, මහසුරනර
5) බුදුපුද, දෙව්දුව, හිරසඳ, දැමිදුරු

11. පහත සඳහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ). නෙළමින් මම යම් යම් උද්‍යානයේ | ආ). මගේ බිසවුනේ අසාපන්

ඉ). සිරි සංඝ බෝධි මාලිගාවේදී මා දැක | ඊ). සැරදේ.. ලක් මවුනි

1) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, ශුද්ධ ක්‍රියා
2) ප්‍රයෝජ්‍ය ක්‍රියා, භාව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
3) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
4) ශුද්ධ ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
5) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, භාව ක්‍රියා

12. කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1) කෑ, පෑ, නෑ, ගෑ
2) කැපුණ, මැරුණ, කැඩුණ, ඉරුණ
3) ලියමන්, රැඟුමන්, ගයුමන්, පිදුමන්
4) මළ, කල, හළ, මතුළ
5) පැහැරෙන, දිවෙන, නැගෙන, කැඩෙන

13. අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් අන්තර්ගත වරණය තෝරන්න.

1) නදීහු, යතිවරුන්, ගිරවුන්, ගංගාවන්
2) තා, ඈ, රජවරු, ලේනියක්
3) යුෂ්මත්හු, හේ, ඕ, රජහු
4) කෙල්ලක, ඇතුන්, ඕතොමෝ, තී
5) තොප, ඔවුන්, දැරියක්, යමෙකු

14. උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

1) අපිරිසිදු, අශිෂ්ට, අමන, අජර
2) දුබික්, දුසිරිත්, දුදන, දුවන
3) අබිනික්මන, අබිමන්, අබිසෙස්, උමග
4) පවර, පබල, පරගැති, පරවැඩ
5) සපිරි, සුපිරි, සප්‍රමාණ, සහේතුක

15. "රටදැයසමය වෙනුවෙන් වෙහෙසෙන දරු පරපුරක් බිහිකිරීමේ උදාරතර සද්කාර්යයෙහිලා නිරත වෙමින් සිටින යහපත් ගුරු පිරිසක් ද මේ සමාජයේ ඇත." යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

1) පූර්ව ක්‍රියා, උපසර්ග, සමාස, කෘදන්ත, තද්ධිත
2) සමාස, කෘදන්ත, උපසර්ග, ප්‍රයෝජ්‍ය ක්‍රියා, නිපාත
3) නිපාත, සමාස, ශුද්ධ ක්‍රියා, කෘදන්ත, උපසර්ග
4) තද්ධිත, උපසර්ග, සමාස, නිපාත, කෘදන්ත
5) සමාස, තද්ධිත, උපසර්ග, මිශ්‍ර ක්‍රියා, නිපාත

16. ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන පදයක් ඇතුළත් වරණය කුමක් ද?

1) බුත්තල, ඉන්නල, කොග්ගල, ගම්පොළ
2) නිදන්න, කියවයි, එත, ලියලියා
3) රටවැසි, මව්කිරි, සහෝදර, නිරවුල්
4) සුමුදු, දුෂ්කර, දුර්මත, ප්‍රවර
5) අහසින්, දෙවියාට, දියණියෝ, එතෙම

17. සමාසයක් නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1) අනුරාග, කුපුරිස්, මීපල්, බමුණුදන්
2) පිත්තල, බොත්තම්, හැට්ටරෙදී, කුරුඳු, තනකිරි
3) ලොරිමුණ, ඉතුන්සයුරු, තිනෙත්, හතරලියද්ද
4) මිනිස්යකා, සැවත්, යායහතර, අසාධාරණ
5) සහතුරුවැල්, මෙසපුටු, වැලිතලප, මායාදේවී

18. එක ම වර්ගයකට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

1) වියැට, පත්තිරු, ගමයා, ගෙවුයන්
2) සිහිනිඟ, රුවනාර, රනඹර, රම්මුතු
3) අල්ලස්, අත්තම්, ගොක්කොල, රුප්පා
4) එලාපල, ශබ්දාලංකාර, රසානුභාව, පාලනාංශය
5) වපරැසින්, බමුරුදූල, මංසල, හබරල

19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

1) අසු මහා සව්වෝ රහසින්වත් පවු නො කළහයි බුදුරජාණෝ පැවසූහ.
2) ඉරයි, හඳයි ලොව ම එළිය කරති.
3) සංචාරයේ යන්නන් ප්‍රවේශම් විය යුතු.
4) ඇඳුරුපා ග්‍රන්ථයක් ලියුවේ ය.
5) සොරු දිවගියහොත් පොලිසිය වෙඩි තබයි.

20. වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

1. අර්ථ වශයෙන් කිසියම් ගැළපීමක් ඇති පදම සමාස කළ යුතුවෙයි.
2. මෙබඳු භාෂා ශක්‍යතාවක් මිනිසා ලබාගත්තේ කෙසේද?
3. ජීව භාෂාවක වෙනස වැඩිපුර ම දක්නට ලැබෙන්නේ එහි වාග් කෝෂයෙහි ය.
4. ඕනෑම බසකට අදාළව වාංමාලාවක් දක්නට ලැබේ.
5. අව්‍ය පද භාවිත නොකොට නිවැරදිව අදහස ප්‍රකාශ කළ නොහැකි ය.

( ලකුණු
20 යි.)

# 11 කොටස

**2. අ).** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘත සෞන්දර්යවේදය නිර්දේශ කළ ආකෘති හා අලංකාර ආශ්‍රයෙන් ගොඩනඟාගත් දේශීය රීතියක් අනුගමනය කරයි. සියබස්ලකර, එළුසඳැස්ලකුණ හා සිදත් සඟරාව සංස්කෘත සෞන්දර්යවේදයේ හරය සිංහල විද්වතුන් වෙත ප්‍රේෂණය කළේ ය.ලෝකෝත්තර නිෂ්යා පෙරටු කර ගත්ත ද කවි සිරුරු ගොඩනැගී ඇත්තේ පොදු ලෞකික අනුභූතින්ගෙනි. අවන්කෙළි, රතිකෙළි, දියකෙළි, වන වැනුම්, පුර වැනුම්, මග වැනුම් ආදි අනුභූතියෙන් නිර්මාණ පිරී තිබේ. මහනුවර-මාතර අවදියෙදී පෞද්ගලික අවශ්‍යතා සපුරාගැනීම හා ප්‍රභූ ප්‍රසාදය දිනාගැනීම සඳහා ද කාව්‍ය නිර්මාණ භාවිතා කරනු පෙනේ.

සිය ප්‍රතිභාව ප්‍රදර්ශනය කරමින් රසාලිප්ත කාව්‍යෝක්ති නිර්මාණය කිරීමට වඩා පාණ්ඩිත්‍ය හා වාග්චාතුර්යය විදහා පාමින් විචිත්‍ර ප්‍රකාශන බිහි කිරීමට කවියන් නැඹුරු වී තිබේ. ඒ අතරට ඇතැමුන් චිත්‍ර බන්ධන නමින් හඳුන්වාගත් දුෂ්කර ප්‍රබන්ධ ද එකතු කර ඇත. රචකයන් බහුතරයක් අර්ථව්‍යක්තියට වඩා වැඩි අවධානයක් ශබ්දමාධූර්යය කෙරේ දක්වා ඇත. ඔවුනට අභිමත වී ඇත්තේ පැහැදිලි ව හා රසවත් ව අත්දැකීම් කවියට නැගීමට වඩා විරිත, යතිය, එළිසමය, අනුප්‍රාසය වනු උපාංග ආශ්‍රයෙන් කවිය ගීතවත් කිරීමයි.

1. සංස්කෘත සෞන්දර්යවේදය අනුගමනය කරන්නේ කුමන රීතියක් ද?
2. මහනුවර- මාතර අවදියේ කාව්‍ය නිර්මාණ භාවිත කළේ ප්‍රභූ ප්‍රසාදය දිනා ගැනීම සඳහා පමණක් ම ද?
3. කාව්‍ය ශරීර ගොඩනැඟීමට වස්තු විෂය වූ දැ මොනවා ද?
4. කවිය ගීතවත් කරනුයේ කුමන අලංකාරයන්ගෙන් ද?
5. 'වාග්චාතුර්යය' හා 'ශබ්ද මාධූර්යය' යන වචනවල අරුත් පහදන්න ( ලකුණු 10 යි.)

ආ). පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලක්දිව නාට්‍ය කලාව කවර මුහුණුවරක් දරන්නේ ද සොයා යන විට පෙනෙනුයේ ආදියෙහි කෙසේ වෙතත් මෑත කාලයක නම් දේශීය ය යි කිව හැකි අංග සම්පූර්ණ වූ කලාත්මක ස්වරූපයක් දරන්නා වූ නාට්‍ය කලාවක් මෙහි නොවූ බව ය. විජය කුමරු ගොඩ බැට දින ඇසුණු තූර්ය නාදයක් ගැනත් එය විවාහෝත්සවයක පවතී නෘත්‍ය ගීත ගායනයක් ආශ්‍රිත වුවක් බැව් කුවේණිය පැවසූ බවත් මහාවංශය පවසයි. පඩුවස් දෙව් රජුට වැළඳුණු දිවි දොස් නිවාරණයට ගාන්ධර්ව කුල බමුණන් දස දෙනෙකු ලවා ශාන්තිකර්ම නෘත්‍ය පූජාවක් කළ බැව් පවසන්නේ කුවේණි අස්න කෘතියයි.

පණ්ඩුකාභය රජ දවස ඔහුගේ මිතුරන් වන චිත්ත රාජ හා කාලවේල සමඟ එකට වාඩි වී හිඳ, නැකත් කෙළි උත්සවයක පැවති ගැමි නැටුම් නැරඹූ බව ද, භාතිකාභය රජු එදා විසූ නාට්‍ය ශිල්පීන් කැඳවා මහා ථූපයත්, මහා බෝධියත් ආසන්නයේ මහා පූජාවක් පැවැත්වූ බව ද, මහා දාඨික මහානාග රජු මිහින්තලා අම්බස්තල චෛත්‍ය පූජාවක් වෙනුවෙන් නාට්‍ය ශිල්පීන් ලවා නැටුම්-ගැයුම් පැවැත්වූ බව ද සඳහන් වන්නේ මහාවංශයෙහි ය. මෙවැනි අතීත තොරතුරු සමහරක් ගැන සෝදිසියක යෙදුණු මාටින් වික්‍රමසිංහ මහතා පවසන කරුණු ද ඇත. ජන නැටුම්, වෙස් නැටුම්, තාණ්ඩව නැටුම් ද හත් වැනි සියවසේදී පවතින්නට ඇතැයි සිතෙන්නේ ලෝවා මහා පායෙහි එන ගල්කුණු කැටයම් නරඹන විට ය. කවි නාටකය ද දඹදෙණි, කෝට්ටේ යුග තරම් ඈතට පැරණි බව ඔහු අදහස් කරයි.

(ලකුණු 15 යි.)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

I. පුරාතන සාහිත්‍ය අධ්‍යයනයේ ඇති වැදගත්කම
II. විදෙස් සාටෝප හා සංස්කෘතික අසහ්‍යත්වය
III. නූතන බෝ නොවන රෝග භීතිකාව
IV. රට වනසන මත් උවදුර
V. ආධ්‍යාත්මික සුවය උදෙසා කලා රසවින්දනය
VI. පෞද්ගලික විශ්වවිද්‍යාල හා මුදලට විකිණෙන අධ්‍යාපනය (ලකුණු 25 යි.)

4. අ). පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

I. වැසියන් රජුට මෙසේ කියත් ලු.
II. ඔවුහු සිංහල වියරණ ඇදුරන් ය.
III. ගෙදර සිටි බල්ලා කොයි?
IV. ශිෂ්‍යයෝ දිනකට පැය කිහිපයක් පාඩම් කළ යුත්තෝ ය.
V. මම සියදෝරිස් නම් කම්කරුවෙකු වෙමි. (ලකුණු 05 යි.)

ආ). පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

I. ජනාධිපතිතුමා ඇමැතිවරියක පත් කළේ ය.
II. ගුරුළුගෝමීහු අමාවතුර රචනා කළහ.
III. කම්කරුවා රථයට පොල් පටවයි.
IV. මිනිස්සු තා බලති.
V. කුලියාපිටියේ බෙර වර්ග සාදයි. (ලකුණු 05 යි.)

ඉ). නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

I. (සමහරු/සමහරුන්) අත්වැල් බැඳ බුදුන් සිසාරා දිවෙති.
II. දන්තයෝ විෂම (වෙයි/වෙති.)
III. බැමිණි (අඟනක/අඟනක්) වූ ය පියකරු.
IV. සිංහලට දක්ෂ (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයන්) දැන් පාසලේ නැත.
V. පාරට කුණු වතුර එවන ගෙවල (හිමියන්/හිමියෝ) කොයි ද? (ලකුණු 05 යි.)

5.. අ). පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

I. නව විදුහල්පතිවරයා ආරෝහපරිණාහ දේහ සම්පත්තියකින් යුක්ත වූ පුද්ගල රත්නයකි.
II. ඔවුන් භාවිත කළ කරුණුවල අනෞචිත්‍ය භාවය නිසා පරාජය තීරණය විය.
III. තත්කාලීන සමාජ තොරතුරු රැසක් අපගේ පුරාතන පොත්පත්හි සඳහන් වී තිබේ. (ලකුණු 03 යි.)

ආ). පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.

I. ශරීරයේ අත් පා ආදිය කපා දැමීම.
II. කිසිඳු උඩඟු බවක් නැති
III. ආහාර පාන හිඟ කාලය (ලකුණු 03 යි.)

ඉ). පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

I. හමනා මඳ .......... නිසා අපගේ ගත ප්‍රබෝධමත් විය.
II. පැරණි ස්ථානවල ........... ජාවාරම තවමත් සිදුවේ.
III. සඳ ........... ලොව පැතිරේ සතර දෙස සිසාරා
IV. බඩු .......... කොල්ලා තවමත් ළමා වයසේ පසුවන්නෙකි.
V. විදෙස් රැකියා සඳහා ජල ........... කාර්මිකයෝ බඳවා ගනිති.
VI. සෑම ජාතක කථාවකට ම අදාළ ............. කථාවක් දක්නට ලැබේ.

( කිරණ / කිරන / නල / නළ / නිදාන / නිධාන ) ( ලකුණු 03 යි.)

ඊ). තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.

I. හිරු එළිය අපට ඉමහත් ප්‍රයෝජනවත් වස්තුවකි.
II. සෑම ගැහැණු ළමයෙක් ම කන්‍යාවියන් නොවන්නී ය.
III. දෙව්රම් වෙහෙරේ අප බුදුරදුන් වැඩසිටින සඳ
IV. නූතන ආදරය අවල කෙළියක් වී හමාර ය.
V. සවන පිනන ගීත මිහිර විඳිති බෝ දනා
VI. හංසයේ වන වැනුම මනහර ය. ( ලකුණු 03 යි.)

6.. තද කළු අකුරෙන් දී ඇති පද කුමන ව්‍යාකරණ අංගයට හා අනුඅංගයකට අයත් දැයි දක්වන්න.

I. ඉහළ පාන්තික ජනතාව අසම්මත ජීවන අරගලයක නිරත වෙති.
II. ගුරුවරු සිසුන්ගේ ප්‍රඥාක්ෂිය විවරකරමින් යහපත් අනාගතයක් කරා පොළඹවති.
III. පුරාතන සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍ය කෘති අතුරෙන් සද්ධර්මරත්නාවලියට ඉතා උසස් ස්ථානයක් හිමිවන බව අවිවාදාත්මක ය.
IV. මාලුවා ලිය වැළදී ගස්කොලවල වැඩියුරුවක් නැති විය. .
V. විදුහල්පතිතුමා පැමිණෙත වහා රැස්වීම ඇරඹිණි. (ලකුණු 15යි.)

7.. අ). පහත සඳහන් යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

I. අකමැත්තෙන් යමක් කිරීම
II. හොඳ මිනිසුන් ලෙස සමාජයට පෙනී සිට වැරදි කිරීම.
III. තමා වැරදි කරමින් අන් අයට උපදෙස් දීම.
IV. තමාගේ අදහස ඉටුවන තුරු අනෙක් අය රැවටීම.
V. යම් දෙයක් ඉවත දැමීමට නො හැකිවීම.
VI. වාසි පැත්තට කවුරුත් කැමති වීම. ( ලකුණු 03 යි.)

ආ). පහත දී ඇති රූඪීවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

I. සුදුලූනු පොඩි කිරීම
II. දෙහි කැපීම
III. අං හරස් කිරීම
IV. කිඹුල් කඳුළු හෙළීම
V. ඔළුව ඉදිමිලා
VI. පාලු ගෙයි වළන් බිඳීම ( ලකුණු 03 යි.)

ඉ). පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

I. ඇඳ-පුටු
II. මැහුම්-ගෙතුම්
III. සිරිත්-විරිත්
IV. දුගී-දුප්පත්
V. බලු-කපුටු
VI. සුබ-අසුබ ( ලකුණු 03 යි.)

ඊ). පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

I. සකලයා
II. පාරක් කරනවා
III. පුස්සනවා
IV. පහළහයි
V. බලලුවාව
VI. රිරිගෙඩිය ( ලකුණු 03 යි.)

උ). පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

I. කොට්ටෝරුවා
II. කිරි කෝඩුකාරයා
III. මුත්තා
IV. අමදිනවා
V. අට හොඳයි
VI. ගෙවදිනවා ( ලකුණු 03 යි.)

**8..** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එඅසාශක්‍රයෝකියන්නෝමමශීලසංරක්ෂණයකරනකෙනෙකුන්ටමදෙමිතෙපිසිල්රකුදයිවිචාළෝයඑබස්ඇසූමනුෂ්‍යයෝඅපි සිල්රැකීමනම්කෙසේවූදෙයකැයිනොදැනුම්හමිලයටදෙවයිකිවාහුයමටමිලයෙන්ප්‍රයෝජනනැතසිල්රක්ෂාකරනකෙනෙකු න්ටමදෙමියිශක්‍රයෝකිවුයමනුෂ්‍යයෝමේතෙමයම්කිසිනළවන්නනෙකැයිකියාගියෝයසුජාතාවෝඑපවත්අසාමටගෙනඑන ලද්දේවනැයිගොස්ස්වාමිනිදුනමැනවයිකීයමැණියනිසිල්රකුදැයිවිචාළෝයඑසේයරකිමිකිකල්හිමාවිසින්මෙකැකිරිතොපට මගෙනඑනලද්දේයයිකියාගැලහාසමඟඇගේගේදොරතබාගියෝයඒස්ත්‍රීදදිවිපමණින්සිල්රක්ෂාකොටඑයින්වුතවඋපනසි ල්රැකිඅනුසසින්විශිෂ්ටරුඇතිවූය

I. ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූලවන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
II. අඝෝෂ අල්පප්‍රාණ සහිත වචන දෙකක් ඡේදයෙන් උපුටා ලියන්න.
III. ඡේදයේ ඇති "ස්වාමීනි" යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.
IV. කොම්බුව හා ගයනුකිත්ත යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.
V. ඉහත ඡේදයෙහි සඳහන් වන පදයක් බන්ධාක්ෂරයක් සහිත ව නැවත ලියන්න. ( ලකුණු 15 යි.)

සැකසුම:- මහේෂ ද අල්විස්